## අදහසක්

### ඒ වෙදකම සහ මේ වෙදකම



කොන්දෙ ඇවිලිල්ලක් ඇවිත් පය බිම තියන්න බැරි වෙලා බේත් ගන්න යද්දි ඉංගිරිසි බේත් දෙන දොස්තර මහත්තුරු ස්ට්‍රැයික් හංදා පාරම්පරික දේශීය වෙදකම් කරන වෙද මහත්තයෙක් ළඟට ගියා. අවශ්‍ය බෙහෙත් වර්ග දීල පත්තුවක් ගාන්න දුන්නා. ගාන තෙලුත් දුන්නා. වරු 10 ට ඇතිවෙන්න තියෙනවා කිව්වා.

බේත් ගන්න කලිං බිල් කඩල රිසිට් දෙන්න කවුරුත් හිටියෙ නෑ. බුලත් කොළේක තියල රුපියල් 500 දුන්නම සෑහීමකට පත් වුණා. ඉස්සර වගේ කෂාය හො යන්නයි, බේත් බඩු කඩ ගානෙ

යන්නයි ඕනෙ නෑ. අඹරන්න අමාරු නම් බ්ලෙන්ඩර් කරගන්නත් යෝජනා කළා.

මේකෙන් නිට්ටාවට සනීප වෙයි. ආයෙ එන්න වෙන්නෙ නෑ..බුදු සරණයි.. කිව්වා.

වරු දහයක් ගියේ නෑ...වරු තුනෙන් ලෙඩේ සනීපයි.

**හෙන්රි වර්ණකුලසූරිය**
ලේඛක / ඉංජිනේරු

# ඩයස්පෝරා රංග මංගල දර්ශනය



සිඩ්නි-කොළඹ රංග ව්‍යාපෘතිය මගින් සංවිධානය කරනු ලැබූ, ප්‍රේක්ෂකයින් සමග සමීපව නාට්‍යමය ස්වරූපයෙන් සමාජ ප්‍රශ්නයක් සාකච්ඡා කෙරෙන පළමු ඩයස්පෝරා රංගයේ මංගල දර්ශනය පසුගිය ජූලි 30 ඉරිදා සන්ධ්‍යාවේ දී සිඩ්නි තදාසන්නයේ පෙමුල්වේ ප්‍රජා මධ්‍යස්ථානයේ දී සාර්ථකව රඟ දැක්විණි.

මෙහි දී සංවාද මණ්ඩප රංග (තදරමප ඔයඒරු) ආකෘතියේ නාට්‍යානුසාරයෙන් සාකච්ඡා කෙරුණේ මැදිවියට පත් වෙත් ම, විවාහකයින් අතර රොමෑන්ටික්බව නැති වී යන්නේ ඇයි ද යන සර්වකාලීන ප්‍රශ්නය යි.

මේ ඩයස්පෝරා රංගය සඳහා රංගන දායකත්වය ලබා දුන්නේ දේවිකා ප්‍රනාන්දු, මිහිරි ප්‍රනාන්දු, සුජීව මුදලිගේ සහ සෑම් මාසාච්චි විසිනි.

සිඩ්නි සිංහල ප්‍රජාව මුල් වරට අත්විඳි ඩයස්පෝරා රංග ආකෘතිය, රඟපෑම් සහ විශේෂයෙන් ම එහි ප්‍රේක්ෂක යෝජනා අනුව සහ ප්‍රේක්ෂක දායකත්වයෙන් රඟ දැක්වුණු දර්ශන කොටස් ප්‍රේක්ෂක සැමගේ සිත් ඇද බැඳ ගත් බව දර්ශනය අවසානයේ ඔවුන් දැක්වූ අදහස්වලින් පෙනුණි.

ඩයස්පෝරා රංගය ප්‍රවීණ නාට්‍යවේදී සහ රචක ධනංජය කරුණාරත්න ගේ අධ්‍යක්ෂණයකි.

පළමු ඩයස්පෝරා රංගයේ දෙවන දර්ශනය අගෝස්තු මස 13 ඉරිදා සවස 4:00 ට පෙමුල්වේ හි දී පැවැත්වෙන අතර තුන්වෙනි දර්ශණය සැප්තැම්බර් මස 17 දින පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

වැඩි විස්තර සඳහා නිෂ්පාදන කළමනාකරු අනිල් ප්‍රනාන්දු (0430216044).

DOCUMENT TRANSLATIONS WITHIN A DAY
SWORN TRANSLATIONS ● NAATI TRANSLATIONS
ඕනෑම භාෂාවකට අයත් ලේඛණයක්
සීඝ්‍රගාමී පරිවර්තනය සඳහා
අප අමතන්න
03 9792 9977
සඳුදා සිට සිකුරදා දක්වා
පෙ.ව 9.00 - ප.ව 5.00 දක්වා විවෘතයි.
1/44 King Street Dandenong VIC 3175
WARNALEGAL
Justice for all
03 9701 3718 info@warnalegal.com warnalegal1

FOR ALL YOUR TRANSLATIONS
PROFESSIONAL TRANSLATOR
NAATI accredited (Level 3)
( ENGLISH SINHALESE)
Documents for immigration purposes
• BIRTH , MARRIAGE, DEATH
• EDUCATIONAL/ VOCATIONAL
• LEGAL and POLICE DOCUMENTS
• NATIONAL IDENTITY CARDS
CONTACT
DR. PREMA KUDALIGAMA
( BA, PGDE, M.A. Ph.D (Edu.)
NAATI Level 3 (Interpreting & Translating)
Tel:(03) 94671658 mob: 0458 60 60 66
Email: premaku@bigpond.com